# බස්නාහිර පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාව

දිනය : 2016.12.23

වේලාව : පෙ.ව. 09.30

ස්ථානය : ප්‍රධාන ලේකම් කාර්යාලය, බස්නාහිර පළාත.

**සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය :**

**1) එම්.ඒ.බී. දයා සෙනරත් මයා - ප්‍රධාන ලේකම් (බ.ප).**

**2) හේමන්ත සමරකෝන් මයා - සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය (බ.ප).**

**3) චන්ද්‍රානි සමරකෝන් මිය - ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප).**

**4) එස්.ජී.විජයබන්ධු මයා - ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය (බ.ප).**

**5) ටී.වී.ඩී.ඩී.එස්.කරුණාරත්න මෙය- ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය (බ.ප).**

**6) එන්.නිල්වල මයා - ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය (බ.ප).**

**7) එම්.කේ.කේ.ආර්.අබේදීර මිය - ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය(බ.ප).**

**8) සිරිසෝම ලොකුවිතාන මයා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු).**

**9) බන්දුල ප්‍රේමකුමාර මයා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය).**

**10) ඩබ්.එම්.ඩී.එන්.රණසිංහ මයා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු).**

**11) ඩී.එම්.එන්.දිසානායක මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්).**

**12) කේ.එන්.සූරියආරච්චි මිය - සහකාර ප්‍රධාන ලේකම් (පාලන).**

**ලේකම්වරුන් විසින් පහත කරුණු පිළිබඳ ව සාකච්ඡා කළ අතර, පහත දක්වා ඇති තීරණයන් ට එළඹෙන ලදි.**

| අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | බස්නාහිර පළාත් සභා කාර්යාල එක ම භූමියක ස්ථාපිත කිරීම. | බත්තරමුල්ල නව පරිශ්‍රයේ රථ වාහන ගාල් කිරීමට ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැති වීම නිසා ඒ සඳහා තෝරා ගත් විකල්ප ස්ථානයක් ලෙස, සිරිලක් වෙළඳසැල ඉදිරියේ ඇති ඉඩම ලබා ගැනීම කෙරෙහි අවධානය යොමු විය.<br>ඒ වෙනුවෙන් පත් කරන ලද කමිටුව සඳහා මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ කොළඹ දිස්ත්‍රික් ව්‍යාපෘති භාර අධ්‍යක්‍ෂ, පළාත් සභා මන්ත්‍රී නිශාන්ත වර්ණසිංහ මහතා ද, ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතිය යටතේ සම්බන්ධ කර ගැනීම සඳහා සාකච්ඡා විය. | සභා ලේකම් සහ කමිටු සාමාජිකයින් |
| 02. | තාක්ෂණ සේවයේ නිලධාරීන් බඳවා ගැනීම. | තාක්‍ෂණ නිලධාරි සහ තාක්‍ෂණ සහකාර තනතුරු බඳවා ගැනීම සඳහා වන බඳවා ගැනීම් පටිපාටියේ අඩුපාඩු සකස් කර, රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් වෙත යැවීමෙන් අනතුරුව, පුවත්පත් දැන්වීම පළ කිරීම සඳහා කටයුතු කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)<br><br>ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව. |
| 03. | නිල නිවාස පිළිබඳ කාර්ය සාධන බලකාය සහ සංචාරක බංගලා ඉදි කිරීම | අනුරාධපුර, නුවරඑළිය සහ කතරගම යන ප්‍රදේශ වල සංචාරක බංගලා ඉදිකිරීමට අවශ්‍ය ඉඩම් මිල දී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීමට සංශෝධිත පුවත්පත් දැන්වීම පළ කිරීම සඳහා ඉදිරි කටයුතු කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු).<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන). |
| 04. | සංවර්ධන වැඩසටහන් සහ ප්‍රගති සමාලෝචනය. | එක් එක් අමාත්‍යාංශ මඟින් ජනවාරි මස මුල් සතියේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති විවිධ ව්‍යාපෘති පිළිබඳ විමසීමක් ප්‍රධාන ලේකම් විසින් සිදු කරන ලදි. | සියලු ම අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 05. | භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් නිල වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම. | පළාත් සභාවේ භාෂා පරිවර්තකයන්ගේ පුරප්පාඩු 18 සඳහා නව බඳවා ගැනීම් සිදු කිරීම.<br><br>තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන ආයතනය (ITRDI) වෙත ඉදිරිපත් කරන ලද, දැනටමත් භාෂාත්‍රයෙන් යාවත්කාලීන කර නොමැති වෙබ් අඩවි හැකි ඉක්මනින් යාවත්කාලීන කර දෙසැම්බර් 30ට පෙර අවසන් කිරීම හා එළි දැක්වීම.<br><br>එසේම, පළාත් වෙබ් අඩවිය, නිරන්තරයෙන් බිඳ වැටීම් වලට ලක් වීම සම්බන්ධව ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සමඟ සාකච්ඡා කර, ඒ සම්බන්ධ වාර්තාවක් ඉදිරිපත් කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |

| | | | |
|---|---|---|---|
| 06. | තොරතුරු දැන ගැනීමේ පනත ක්‍රියාත්මක කිරීම | තොරතුරු දැන ගැනීමේ පනත ක්‍රියාත්මක කිරීම සඳහා වන තොරතුරු නිලධාරීන් සඳහා පුහුණු සැසියක් ජනවාරි දෙවන සතිය වන විට සැලසුම් කිරීමට ඇති බැවින්, පහත සඳහන් අමාත්‍යාංශ වලට අයත් ආයතන වල නිලධාරීන්ගේ තොරතුරු කඩිනමින් යොමු කිරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් දැන්වීය.<br>• පළාත් පාලන අමාත්‍යාංශය<br>• අධ්‍යාපන අමාත්‍යාංශය | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)<br><br>අදාළ අමාත්‍යාංශ ලේකම්වරු |
| 07. | E-recording (SLT Server / Cloud Server) සහ බස්නාහිර පළාත් වෙබ් පිටුව | බස්නාහිර පළාතේ ආයතන වලින් ලබා දෙන සේවාවන් වැඩිදියුණු කිරීමට තොරතුරු තාක්‍ෂණය යොදාගැනීම පිළිබඳ මඟ පෙන්වීම සඳහා වන කමිටු වාර්තාව, කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් විසින් ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කරන ලදි.<br><br>මේ සඳහා සියලු ම ආයතන ප්‍රධානීන් සමඟ සාකච්ඡා කර, පවතින තත්ත්වය අධ්‍යයනය කර වාර්තාවක් සකසා ජනවාරි දෙවන සතිය වන විට ක්‍රියාකාරකම් ආරම්භ කිරීම. | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය සහ කමිටු සාමාජිකයන් |
| 08. | 2017 - දිළිඳුකමින් නිදහස් කිරීමේ වර්ෂය | "2017 - දිළිඳුකමින් නිදහස් කිරීමේ වර්ෂය" පිළිබඳ අතිගරු ජනාධිපතිතුමන් සමඟ පැවති රැස්වීමේ දී සාකච්ඡා වූ කරුණු කෙරෙහි ප්‍රධාන ලේකම් විසින් අවධානය යොමු කරවන ලදී.<br>• 2017 වසරේ නියං කාලගුණයක් අපේක්ෂා කරන බැවින්, ප්‍රධාන වශයෙන් කෘෂිකර්ම ක්ෂේත්‍රයට වැඩි අවධානයක් යොමු කිරීම.<br>• සියලුම රජයේ කාර්යාල සහ පාසල් ආශ්‍රිතව, වගා කළ හැකි සෑම ස්ථානයක ම නියඟයට ඔරොත්තු දිය හැකි බෝග වගා කිරීම.(උදා. සෝයා බෝංචි, බතල වැනි.)<br>ඒ අනුව, පළාත් සැලැස්මක් සැකසීම කෙරෙහි අවධානය යොමු කරන ලෙස හා ඒ සඳහා පහත කරුණු පිළිබඳ සැලකිලිමත් වන ලෙස ප්‍රධාන ලේකම් විසින් දැනුම් දෙන ලදි.<br>• පළාත් සභා වල නිර්මාණශීලී වගා කරුවන් දිරිමත් කිරීම.<br>• කාන්තාවන් උපරිම වශයෙන් දායක කර ගැනීම.<br>• තරගකාරී ස්වරූපයක් ඇති කිරීම.<br>• රසායනික පොහොර වෙනුවට කාබනික පොහොර භාවිතය දිරිමත් කිරීම.<br>• මේ සඳහා ප්‍රචාරයක් ලබා දීමට කටයුතු කිරීම. | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය.<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |

**නව යෝජනා**

| අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | 2017 - නව වසරේ රාජකාරි කටයුතු ඇරඹීම | නව වසරේ රාජකාරි කටයුතු ඇරඹීම වෙනුවෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් නිකුත් කරන ලද රා/පරි. චක්‍රලේඛ 27/2016 සම්බන්ධව ලේකම්වරුන් දැනුවත් කිරීම. | සියලු ම අමාත්‍යාංශ ලේකම්වරුන් |
| 02. | "වැසි සහිත යහපත් කාලගුණයක් සඳහා රටට සහ ජනතාවට ආශීර්වාද පැතීම" යන මැයෙන් ජනාධිපති ලේකම් විසින් යොමු කරන ලද ලිපිය. | වැසි සහිත යහපත් කාලගුණයක් සඳහා රටට සහ ජනතාවට ආශීර්වාද පැතීම වෙනුවෙන්, ජනවාරි 02 එනම්, නව වසරේ රාජකාරි කටයුතු අරඹන දින ආගමික වතාවත් සිදු කර, වැසි පිරිත සජ්ඣායනා කිරීම සඳහා කටයුතු කිරීම. | සියලු ම අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 03. | රජයේ ආයතන වෙත ලැබෙන දුරකතන ඇමතුම් සඳහා පිළිතුරු ලබා දීම. | රජයේ ආයතන වෙත ලැබෙන දුරකතන ඇමතුම් සඳහා පිළිතුරු ලබා දීම වෙනුවෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් නිකුත් කරන ලද රා/පරි. චක්‍රලේඛ 25/2016 කෙරෙහි ලේකම්වරුන් දැනුවත් කිරීම. | සියලු ම අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>සියලු ම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් |
| 04. | සංවර්ධන නිලධාරි අතිකාල දීමනා ලබා දීම. | කාර්යාල ගත සේවයේ යෙදෙන සංවර්ධන නිලධාරීන්ගේ අතිකාල දීමනා ඉල්ලීම ඉටු කළ නොහැකි බව තීරණය කරන ලදි. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 05. | කලාප අධ්‍යාපන කාර්යාල වෙත අනුයුක්ත කරන ලද සංවර්ධන නිලධාරි (විමර්ශන) හට දීමනා ලබා දීම. | සංවර්ධන නිලධාරි (විමර්ශන) හට අනුමත කරන ලද රු.2500/-ක මාසික ගමන් වියදම් දීමනාව 2017 ජනවාරි 01 දින සිට ගෙවීම සඳහා කටයුතු කිරීම. (ප්‍රධාන ලේකම්ගේ CSO/CSP/04/03 හා 2016.11.30 දිනැති ලිපිය මඟින් ඉදිරිපත් වූ යෝජනාව) | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය. |
| 06. | අධ්‍යාපන ඇමතිතුමා භාවිතා කරන නිල වාහනය අනතුරකට භාජනය වීම සම්බන්ධව | අධ්‍යාපන ඇමතිතුමාගේ නිල වාහනය අනතුරකට භාජනය වීම නිසා, එය අලුත්වැඩියා කිරීම් අවසන් වන තෙක්, මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයට පරිබාහිරව, කෙටි කාලීනව, වාහනයක් ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් සකස් කර ඉදිරිපත් කිරීම. | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, |
| 07. | සෞඛ්‍ය අමාත්‍යාංශයේ සංවර්ධන නිලධාරීන් සම්බන්ධ ගැටලුව | (සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් ඉදිරිපත් කරන ලද WPH/A12/2/16 අංක හා 2016.12.21 දිනැති ලිපිය මඟින් ඉදිරිපත් වූ යෝජනාව)<br>I. සංවර්ධන නිලධාරි (විමර්ශන හා අභ්‍යන්තර විගණන) තනතුරු 6ක් අලුතින් ඇති කිරීම සඳහා මුදල් රෙගුලාසි 71 ආකෘතිය මඟින් නව යෝජනාවක් ලෙස ඉදිරිපත් කිරීම.<br>II. සංවර්ධන නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු 2017 වසරේ දී ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම.<br>III. සංවර්ධන නිලධාරි සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව විභාගයක් පවත්වා නිලධාරීන් බඳවා ගැනීමට ඉදිරියේ දී අපේක්ෂා කරන බව ප්‍රධාන ලේකම් ප්‍රකාශ කරන ලදි. | ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය.<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |

| | | | |
|---|---|---|---|
| 08. | පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන ඉක්මවා වියදම් කිරීම. | දැනට මහජනතාව වෙනුවෙන් වෙන් කර ඇති මුදල් ඔවුන් වෙත ලබා දීමට කටයුතු ලෙසත්, මේ සම්බන්ධව ඉදිරියේ දී විනයානුකූලව කටයුතු කරන ලෙසත් ප්‍රධාන ලේකම් අවධාරණය කරන ලදි. | ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය.<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) |
| 09. | ගරු ආණ්ඩුකාරතුමාගේ අධීක්ෂණය යටතේ හොරණ ඉදිවන මාර්ගය | ගරු ආණ්ඩුකාරතුමාගේ අධීක්ෂණය යටතේ හොරණ ප්‍රදේශයේ ඉදිවන මාර්ගය නිරීක්ෂණය කිරීම සඳහා ජනවාරි 05 වන දින ගරු ආණ්ඩුකාරතුමා පැමිණෙන බැවින් කඩිනමින් එහි කටයුතු අවසන් කිරීම. | ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය. |
| 10. | වෙනිවැල්කොල ව්‍යාපෘතියට අයත් අත් කඩදාසි යන්ත්‍ර කොළොන්නාව කසල අංගනයට බැහැර කිරීම. | වෙනිවැල්කොල ව්‍යාපෘතියට අයත් අත් කඩදාසි යන්ත්‍රයෙන් නිසි පරිදි ප්‍රයෝජනයක් නොගෙන දිරාපත් වීම සම්බන්ධව වර්තමාන තත්ත්වය පිළිබඳ වාර්තාවක් 2016.12.26 දිනට පෙර ලබා දෙන ලෙස ප්‍රධාන ලේකම් දැනුම් දෙන ලදි.<br><br>එම යන්ත්‍රයේ කොටස් කොලොන්නාව කසල අංගනයේ තිබෙන බවට තොරතුරු වාර්තා වී ඇති බැවින්, පරීක්ෂා කර බලා කොළොන්නාව නගර සභා භාරයට ගන්නා ලෙස දන්වා ලිපියක් යොමු කරන ලෙස ප්‍රධාන ලේකම් දන්වන ලදි. | ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය.<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |